දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ්අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதார அமைச்சு
Ministry of Health

මගේ අංකය )
எனது இல ) NA/04/SG/TRANSFER/2019
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2020.10. 15
Date )

---

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලංකා ජාතික රෝහල)
අධ්‍යක්ෂ (ජාතික රෝහල මහනුවර)
ශික්ෂණ රෝහල් , මහ රෝහල් අධ්‍යක්ෂවරුන් හා
සියලුම හෙද විදුහල්පතිවරුන් වෙත.

**<u>විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරි (අධ්‍යාපන) තනතුරේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2019</u>**

විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරි (අධ්‍යාපන) තනතුරේ සිටින නිලධාරීන්ගේ ස්ථාන මාරු ලබාදීමට අදාලව නිකුත් කරන ලද පොදු චක්‍රලේඛ අංක 02-147/2019 හා 2019.12.12 දිනැති ස්ථාන මාරු අයදුම්පත් කැඳවීමේ නිවේදනය හා බැඳේ.

02. ඒ අනුව අදාල පොදු චක්‍රලේඛ ලිපියට අනුකූලව ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කරන ලද විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරීන්ගේ ස්ථාන මාරු සම්බන්ධයෙන් වූ නිර්දේශය ඇමුණුම 01 මඟින් දැක්වේ.

03. විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරි (අධ්‍යාපන) තනතුරට උසස් වී අදාල තනතුරේ වැඩ භාරගත් දිනය අනුව සකස් කරන ලද ජ්‍යෙෂ්ඨතා ලේඛනයට අනුකූලව පවතින පුරප්පාඩු හා නිලධාරීන්ගේ කැමැත්ත සලකා බලා ස්ථාන මාරු නිර්දේශය ලබා දී ඇත. එහිදී එකම දින විශේෂ ශ්‍රේණියට උසස් වී එකම දින සේවයට වාර්තා කරන ලද නිලධාරීන්ගේ 1 ශ්‍රේණියේ හෙද නිලධාරීන්ගේ (අධ්‍යාපන) තනතුරට උසස් වූ දිනය අනුව ජ්‍යෙෂ්ඨතාවය තීරණය කර ඇති අතර, 1 ශ්‍රේණියේ හෙද නිලධාරි (අධ්‍යාපන) තනතුරට උසස් වූ දිනය ද සමාන වන්නේ නම් ඔවුන් පශ්චාද් ප්‍රාථමික හෙද විදුහලේ හදාරන ලද වාට්ටු කළමණාකරණ හා අධීක්ෂණ පුහුණු පාඨමාලාවේ අවසන් පරීක්ෂණයේ දී ලබාගත් කුසලතාවය අනුව ද එම කුසලතාවය ද සමාන වන්නනේ නම් මුල් පත්වීම් දිනය අනුව ජ්‍යෙෂ්ඨතා ලේඛනය සකස් කර ඇති බව සලකන්න.

04. මෙම ස්ථාන මාරු ලේඛනය සම්බන්ධව යම් පාර්ශවයකට විරෝධතා පවතී නම් එම විරෝධතා / නිවැරදි කිරීම් සහ අභියාචනා පහත ලිපිනයට / ෆැක්ස් අංක වලට 2020.10.25 දිනට ප්‍රථම දැනුම් දීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

අධ්‍යක්ෂ (පාලන) 01
සෞඛ්‍ය අමාත්‍යාංශය
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ 10

ෆැක්ස් අංක - 0112674967 /

05. අදාල විරෝධතා හා අභියාචනා සලකා බැලීමෙන් අනතුරුව අවසන් ලේඛනය සකස් කරන බැවින් මෙම මෙම ලේඛනය අවසාන ලේඛනය නොවන බව කාරුණිකව සලකන්න.

06. අවසන් ලේඛනය සෞඛ්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි (**www.health.gov.lk**) පළ කරනු ලබන අතර, විරෝධතා / නිවැරදි කිරීම් හා අභියාචනා සම්බන්ධ තීරණය පෞද්ගලිකව කිසිම නිලධාරියෙකුට දැනුම් දෙනු නොලැබේ.

ඒ.එම්.කේ.කේ. අත්තනායක,
අතිරේක ලේකම් (පාලන) 02,
ලේකම් වෙනුවට,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

ඒ. එම්. කේ. කේ. අත්තනායක
අතිරේක ලේකම් (පාලන) II
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.